Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

ශ්‍රේණිය : 6

විෂය : ගණිතය

සතිය : 17

පාඩම :- ඝන වස්තු

කාලච්ඡේද ගණන :- 08


- පෙළ පොතේ 70, 71 පිටු හොඳින් අධ්‍යයනය කරන්න. ඝන වස්තුවක් යනු කුමක්දැයි නිවැරදිව හඳුනාගන්න.

| |
|---|
| අවකාශයේ යම් ඉඩක් ගන්නා නියත හැඩයක් ඇති වස්තු ඝන වස්තු නම් වේ. |


- තල පෘෂ්ඨය වක්‍ර පෘෂ්ඨය නිවැරදිව හඳුනාගන්න.

පහත දැක්වෙන ඝනවස්තුවල මුහුණත, පෘෂ්ඨය නිවැරදිව ලකුණු කරන්න.

උදා:-




මුහුණත



වක්‍ර පෘෂ්ඨය






පහත දැක්වෙන ගැටළු සඳහා නිවැරදි පිළිතුරු සපයන්න.

I. මුහුණත් පමණක් ඇති ඝන වස්තු දෙකක් නම් කරන්න.
II. වක්‍ර පෘෂ්ඨ කොටස් පමණක් ඇති ඝන වස්තු දෙකක් නම් කරන්න.
III. දොඩම් බැයක මුහුණත් කීයද? වක්‍ර පෘෂ්ඨ කොටස් කීයද?
IV. කොස් ඉරුවක ඇති මුහුණත් ගණන වක්‍ර පෘෂ්ඨ කොටස් ගණනත් වෙන වෙනම ලියන්න.


- පෙළ පොතේ 71, 72 පිටු හොඳින් අධ්‍යයනය කරන්න. ඝන වස්තුවක ඇති දාර ශීර්ෂ නිවැරදිව හඳුනාගන්න.
- ඝන වස්තුවක දාර ආකාර දෙකක් ඇති බව හඳුනාගන්න.

උදා:-




ඝන වස්තු වල දාර තුනක් හෝ වැඩි ගණනක් හමුවන ලක්ෂ්‍යය ශීර්ෂයක් නම් වේ.

උදා:-





පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| ඝනවස්තුව | මුහුණත් ගණන | වක්‍ර පෘෂ්ඨ කොටස් ගණන | සරල දාර ගණන | වක්‍ර දාර ගණන | ශීර්ෂ ගණන |
|---|---|---|---|---|---|
| ගිනිපෙට්ටිය | | | | | |
| කිකිලි බිත්තරය | | | | | |
| පොත | | | | | |
| මාළු ටින් එක | | | | | |
| උල් නොකළ පැන්සල | | | | | |
| කෙසෙල් පොතු කැබැල්ල | | | | | |

පහත දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. දාර නොමැති ඝන වස්තුවක් නම් කරන්න.
II. කෙසෙල් පොතු කැබැල්ලකට මුහුණ කීයක් වෙයිද?
III. ශීර්ෂ නොමැති ඝනවස්තු තුනක් නම් කරන්න.

රූප සටහනේ දැක්වෙන්නේ ලී කුඤ්ඤයකි. එය දාර කීයද? මුහුණත් කීයද? ශීර්ෂ කීයද?



- පෙළ පොතේ 72 පිටුව බලන්න. 17.1 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. ඔබට මතුවන ගැටලු ගුරුතුමා / ගුරුතුමිය සමඟ සාකච්ඡා කොට නිවැරදි කරගන්න.

- දාදු කැටයක් සපයාගන්න. එය මුහුණත් 1,2,3,4,5,6 ලෙස අංකනය කරන්න. අංක එක මුහුණත කඩදාසියක් මත තබා දාර වටා පැන්සලකින් දාර ඇඳගන්න. ඔබට ලැබුණු රූපයේ හැඩය කුමක්ද? දාදු කැටයේ ඉතිරි මුහුණත් මෙම රූපය මත තබා සසඳන්න.


- දාදු කැටයේ
  I. මුහුණත් කීයද?
  II. මුහුණත් හැඩයෙන් සමාන ද?
  III. මුහුණත් ප්‍රමාණයෙන් සමාන ද?
  IV. දාර කීයද?
  V. දාර දිගින් සමානද?
  VI. ශීර්ෂ කීයද?

| |
|---|
| දාදු කැටයක් වැනි වස්තුවක් ඝනකයක් නම් වේ. |

- ගිනි පෙට්ටියක් ගෙන එහි මුහුණත් ඔබේ පොත මත තබා ඒ වටා පැන්සලකින් ඇඳගන්න. ලැබෙන රූපය පිළිබඳව තොරතුරු විමසන්න.

| |
|---|
| ගඩොල් ගිනිපෙට්ටිය වැනි වස්තුවක හැඩය ඝනකාභයක් නම් වේ. |

- පහත දැක්වෙන ඝනකාභයේ දාර, ශීර්ෂ, මුහුණත් නම් කරන්න.



- පෙළ පොතේ 73, 74 පිටු හොඳින් අධ්‍යයනය කරන්න. ක්‍රියාකාරකම දෙකෙහි දැක්වෙන ඝනකයක පතොරම බ්‍රිස්ටල් බෝඩ් එකකින් වැනි ඝන කඩදාසියක ඇඳගන්න. එහි දැක්වෙන තොරතුරු අනුව ඇලවුම් වාසි ඇලවීමෙන් ඝනකයක ආකෘතිය ලබාගන්න.

- පෙළ පොතේ 75 පිටුව බලන්න. 17.2 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. ඔබට මතුවන ගැටලු ගුරුතුමා / ගුරුතුමිය සමඟ සාකච්ඡා කොට නිවැරදි කරගන්න.

- පෙළ පොතේ 76 පිටුව නිවැරදිව අධ්‍යයනය කරන්න. ක්‍රියාකාරකම් 3 සඳහා ඝනකාභයේ පතරොම නිවැරදි ඇඳගන්න. ඇලවුම් වාසි නිවැරදිව අදාල පරිදි සකස් කර ඝනකාභයේ ආකෘතිය ලබාගන්න.

- පෙළ පොතේ 77 පිටුව බලන්න. 17.3 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. ඔබට මතුවන ගැටලු ගුරුතුමා / ගුරුතුමිය සමඟ සාකච්ඡා කොට නිවැරදි කරගන්න.

- පෙළපොතේ 78, 79 පිටු හොඳින් අධ්‍යයනය කරන්න. ක්‍රියාකාරකම හතර නිවැරදිව අධ්‍යයනය කරමින් චතුස්තලයක පතොරම නිවැරදිව හඳුනාගන්න. බ්‍රිස්ටල් බෝඩ් එකකින් වැනි ඝන කඩදාසියක ඉහත පතරොම ඇඳ කපාගන්න. ඇලවුම් වාසි නිවැරදිව අලවා ගනිමින් චතුස්තලයක ආකෘතියක් ලබා ගන්න.

| |
|---|
| සියලුම මුහුණත් එකිනෙකට සමාන වූ ද සියලු දිගින් සමාන වූ ද චතුස්තලයක් සවිධි චතුස්තලයක් නම් වේ. |

80 පිටුව බලන්න. 17.4 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. ඔබට මතුවන ගැටළු නිවැරදි කර ගැනීමට ගුරුතුමා / ගුරුතුමිය හමුවන්න.

පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| ඝනවස්තුවේ නම | දාර ගණන | ශීර්ෂ ගණන | මුහුණත් ගණන | මුහුණතක හැඩය |
|---|---|---|---|---|
| සවිධි චතුස්තලය | | | | |
| ඝනකය | | | | |
| ඝනකාභය | | | | |

ඝන වස්තු කිහිපයක් එකට සම්බන්ධ කිරීමෙන් සෑදෙන වස්තුව සංයුක්ත ඝන වස්තුවක් නම් වේ.

පෙළපොතේ 80, 81 පිටු බලන්න. ක්‍රියාකාරකම 5 නිවැරදිව අධ්‍යයනය කරන්න.

81 පිටුවේ 17.5 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. ඔබට මතුවෙන ගැටලුවක් ගුරුතුමා / ගුරුතුමිය සමඟ සාකච්ඡා කොට නිවැරැදි කර ගැනීමට උත්සාහ ගන්න.